
ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
දෙහිවල, සුදර්ශන පාරේ, ශ්‍රී සුදර්ශන ධර්ම නිකේතනයේ පිහිටි දෙහිවල බෞද්ධෝදය සංගමය
මගින් ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක පොහෝ දිනයක්
පාසා නිකුත් කරන මාසික දහම් කලාපය.

# බෞද්ධෝදය



"ධම්මො හවෙ රක්ඛති ධම්මචාරී"

71 වර්ෂය - ශ්‍රී බු.ව 2560 2016 සැප්තැම්බර් 16 බිනර කලාපය

**රාජකීය පණ්ඩිත ශාස්ත්‍රපති**
**පූජ්‍ය ඌරුගමුවේ අස්සජි හිමි**

## සිතීමේ හා විමසීමේ නිදහස

**"එථ තුම්හෙ කාලාමා මා අනුස්සවෙන,මා පරම්පරාය, මා ඉති කිරාය, මා පිටකසම්පදානේන, මා තක්ක හේතු, මා නය හේතු මා ආකාරපරිවිතක්කෙන, මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා, මා භබ්බරූපතාය, මා සමණො නො ගරූ "ති.**
**(කාලාම සූත්‍රය)**

සැදැහැවත්නි,

මෙලොව උපන් සෑම සත්ත්වයෙකුටම උපතින්ම යම් නිදහසක් උරුම වී තිබේ. ජීවත්වීමේ නිදහස ඉන් පළමුවැන්නයි. අනවශ්‍ය බැඳීම, යටත්වීම සහ පීඩනයන්ගෙන් තොරව නිදහසේ ජීවත්වීමට සැවොම ප්‍රිය කරති.

සියලු සත්ත්ව වර්ගයා ජීවත්වනුයේ එකම සමාජයක ඒකාකාරී රාමුවක් තුළය. එක් මිනිස් වර්ගයක නිදහස පිළිබඳ යම් යම් සීමාවන් පැණවීම හෝ නිදහස සහ මුලින්ම අහෝසි කර දැමීම මානුෂික වශයෙන් මෙන්ම සදාචාරාත්මක වශයෙන් ද කිසිදු හේතු යුක්ති සහගත ක්‍රියාවක් නොවේ. ලොව ජීවත්වන සියලු සත්ත්ව වර්ගයාට උත්තරීතර මානව නිදහසක් උදාකර දීම සඳහා වූ සර්වකාලීන හා සර්වභෞමික දේශනයක් පළමුවෙන්ම ලෝකයාට ඉදිරිපත් කළේ බුදුරජාණන් වහන්සේය. ප්‍රාග් බෞද්ධ හා බුද්ධකාලීන භාරතීය සමාජ පසුබිම පිළිබඳ විමසා බැලීමේදී එකල මිනිසුනට යටත් පිරිසෙයින් ජීවිතය පවත්වාගෙන යාමටවත් කිසිදු නිදහසක් උරුමව නොපැවතිණි. බමුණන් විසින් වර්ග කරන ලද චතුර්වර්ණය පදනම් කරගෙන එකල සමාජය සකස්ව තිබුණි. බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය හා ශුද්‍ර යනු එම චතුර්වර්ණයයි. මෙම වර්ගීකරණයට අනුව බමුණන් පූජකයන් හා ගුරුවරුන් ලෙසද, රජුගේ උපදේශකවරුන් ලෙසද පෙනී සිටි අතර, මිනිස් සමාජය උසස් - පහත් වශයෙන් මහාබ්‍රහ්මයා විසින් මවන ලදැයි යන්න ඔවුන ගේ නිසැක පිළිගැනීම විය. ක්ෂත්‍රිය වංශකයිනට රාජ්‍ය පාලන තන්ත්‍රය මෙහෙයවීමත්, කෘෂි කර්මාන්තය කරවීමත්, යාග කරවීමත්, නියමිතව පැවතිණි. වෛශ්‍යයනට වාණිජමය කටයුතු පැවරී තිබුණ අතර, ශුද්‍ර වංශිකයාට උරුම වූයේ පූර්වෝක්ත වර්ණත්‍රයට බැල මෙහෙවර කිරීමයි. මෙකී වර්ණත්‍රයට උරුම වූ මිනිස් අයිතිවාසිකම් කිසිවක් ඔවුනට උරුම නොවීය.

ඒ මතු නොව තත් යුගය වන විට භාරතීය සමාජයේ කාන්තාවනට හිමි වූයේ ද ඉතා පහත් තත්වයකි. ශුද්‍රයිනට සේම සාමාන්‍ය මිනිස් අයිතිවාසිකම් වූ ඉගෙනීම හා ආගමික කටයුතු වල යෙදීම ආදි කටයුතු පවා ඔවුනට අහිමි විය. රටේ පවත්නා පොදු නීති පවා කාන්තාව සම්බන්ධයෙන් වෙනස් වූ අතර එදා සමාජයේ කාන්තාවක මැරීම පිරිමියකු මැරීම තරම් බරපතල ක්‍රියාවක් නොවේය, යන අදහස ද මුල් බැසගෙන පැවතිණි. එබැවින්, එකල ස්ත්‍රියක වී ඉපදීම ද බරපතල පාපයක් සේ සැලකීය. මෙසේ සකස්ව පැවති විෂම සමාජ රටාවෙහි පවත්නා නිස්සාරත්වය මනාව මහජනයාට තේරුම් කර දුන් බුදුරජාණන් වහන්සේ උපතින් කෙනෙකු බ්‍රාහ්මණයකු හෝ වසලයකු නොවන බවත්, එය පුද්ගල ක්‍රියාකාරකම් මත තීරණය වන බවත්, තර්කානුකූලව පැහැදිලි කළහ. ඒ ඇතුලු මිනිස් සමාජයේ නිදහස වෙනුවෙන් උන්වහන්සේ සිදු කළ දේශනා සියල්ල මං මුලා වූ ජන සමාජයකට නිසි මග පෙන්වා දීමක්ම විය.

ඒ අතර සිතීමේ හා විමසීමේ නිදහස වැනි ඉතා සාරවත් ඉගැන්වීමක් එම විෂය පිළිබඳ වූ ආගමික ඉතිහාසයෙහි අන් කවර තැනෙකවත් දක්නට නොමැත. තමාම සත්‍යය අවබෝධ කර ගැනීමෙන් හැර දේවාශිර්වාදය වැනි බාහිර පිළිවෙතක පිහිටෙන් මිනිසෙකුට දුකින් මිදිය නොහැකි බව උන්වහන්සේ දේශනා කළහ. මෙම දේශනාව සඳහා මුල් පසුබිම මෙසේය. වරක් කොසොල් දනව්වෙහි චාරිකා කරන සමයෙක බුදුරජාණන් වහන්සේ කාලාමයන් ගේ කේසපුත්ත නම් නියම් ගමට වැඩම කළහ. කාලාමයෝ උන්වහන්සේ හමු වී මෙම කරුණ ප්‍රකාශ කළහ.

"ස්වාමීනි, කේසපුත්තයට වරින්වර පැමිණෙන මහණ බමුණෝ වෙති. ඔවුහු ස්වකීය ලබ්ධිය (වැළඳගැනීම) ප්‍රකාශ කරති. අන්‍ය ලබ්ධීන් සියල්ල හෙළා දකිති. බැහැර කරති. පරිභව කරති. ස්වාමීනි මෙහි දී කවුරු ඇත්ත කියත් ද කවුරු බොරු කියත් ද යනුවෙන් අපට සැකයක් ඇති වේ."

මෙහිදී බුදුරදුන් ඔවුනට අවධාරණය කළේ ආගම් පිළිබඳ ඉතිහාසයේ සෙසු කිසිම තැනෙක දක්නට නොලැබෙන උපදේශයකි.

"කාලාමයෙනි, ඔබ සැක කිරීමත් විමතියට පැමිණීමත් සුදුසුමය. ඔබගේ සැකය ඇති වූයේ සැකය ඇති වූයේ සැක ඇති විය යුතු තැනෙකමය." පසුව යමක් නොපිළිගත යුතු ආකාර 10 ක් පෙන්වා දුනි.

**01. මා අනුස්සවේන - අනුශ්‍රැතියෙන් හෙවත් කුඩා කල සිට පුරුදු පමණින් යමක් නොපිළිගන්න.**

**02. මා පරම්පරාය - පරපුරෙන් පරපුරට පිළිගෙන පැමිණි පමණින් යමක් නො පිළිගන්න.**

**03. මා ඉතිකිරාය - මෙය මෙසේ වී යැයි මිනිසුන් අතර කතා පැතිර පවතින පමණින් යමක් නො පිළිගන්න.**

**04. මා පිටකසම්පදානේන - තමා උගත් ග්‍රන්ථ වල සඳහන් පමණින් හෝ යමක් නො පිළිගන්න.**

**05. මා තක්කහේතු - තර්කයට එකඟ නිසා හෝ යමක් නොපිළිගන්න.**

**06. මා නයහේතු - කිසියම් න්‍යායකට එකඟ නිසා හෝ යමක් නො පිළිගන්න.**

**07. මා ආකාරපරිවිතක්කේන - පෙනෙන හැටියට හරි යැයි කියා හෝ යමක් නො පිළිගන්න.**

**08. මා දිට්ඨිනිජ්ඣානක්ඛන්තියා - තමන් පිළිගෙන ඇති කිසියම් දෘෂ්ටියකට ගැලපෙන නිසා හෝ යමක් නො පිළිගන්න.**

**09. මා භබ්බරූපතාය - කියන පුද්ගලයා ගේ යහපත්කම සලකා හෝ යමක් නො පිළිගන්න.**

**10. මා සමණො නො ගරු - මේ අපේ ගුරුතුමා යැයි කියා හෝ යමක් නො පිළිගන්න.**

යමක් පිළිගත යුතු ආකාරය මෙසේ දැක්විය. යම් විටෙක මේ දේ අයහපත්ය, අකුසලය, වරදය යි ඔබටම වැටහෙන්නේ ද එවිට එය අත්හැර දමන්න. එසේ ම, යම් විටෙක මේ දේ යහපත්ය, කුසලය, නිවැරදි යැයි ඔබටම වැටහෙන්නේ ද එවිට එය පිළිගෙන පිළිපදින්න."

කාලාමයෝ මෙම දේශනාව මනාව තේරුම් ගත්හ. එයම පිළිගත්හ. තෙරුවන් සරණ ගිය උපාසකයෝ බවට ද පත් වූහ. විචාර පූර්වකව නිගමනයකට එළඹීමට අනුගාමිකයන්ට අවස්ථාව සලසාදීමත් මෙමගින් අදහස් වෙයි. ඉතා ප්‍රකට චූල්ලහත්ථිපදෝපම සූත්‍රයට අනුව යමෙකු කිසියම් නිගමනයකට එළඹිය යුත්තේ එකවරම නොව ඒ පිළිබඳව දීර්ඝ අවධානයකින් පසුවයි. එහි දැක්වෙන පරිදි පා සටහන් අනුව ගොස් ඇතා දැකීමෙන්ම මෙම ඇතා නියම හස්තියෙක් යැයි නිගමනයකට එළඹිය යුතු බව කියවෙයි. මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයට අනුව බුදුරදුන් උපාලි ගෘහපතියාට අවවාද දෙන්නේ "ඔබ වැනි කීර්තිමත් පුද්ගලයෙකු මෙවැනි හදිසි තීරණ වලට නො එළඹිය යුතු බවත්, තව දුරටත් දීර්ඝ වශයෙන් සිතා බලා නිගමන වලට එළඹිය යුතු බවත්ය. හදිසි නිගමන වලට එළඹිය යුත්තේ ඒ පිළිබඳව තම චින්තනය දීර්ඝ වශයෙන් මෙහෙයවීමෙන් පසුව යැයි ද භයභෙරව සූත්‍රයේ ද දැක්වෙයි.

අප ඉහත මාතෘකා කරගත් කාලාම සූත්‍රය ලෝකයේ විද්වත් ජනයා අතර මහත් සම්භාවනාවට ලක් වූවකි. එහි බුදු දහම භක්තියට නොව බුද්ධියට මුල් තැන දෙන ඉගැන්වීමක් බව විස්තර කෙරෙන හෙයිනි. එහි එක් තැනෙක තර්කය ද යමක් පිළිගැනීමේ මාර්ගය නොවන බව කියැවුණි. තර්කයෙන් එළඹෙන තීරණ ඇතැම් අවස්ථාවන් හිදී සත්‍ය නොවේ. එය මෙසේ පෙන්වා දිය හැකිය.

**01. නිවැරදිව තර්ක කොට නිවැරදි නිගමන වලට එළඹීම.**

**02. නිවැරදිව තර්ක කොට වැරදි නිගමන වලට එළඹීම.**

**03. වැරදියට තර්ක කොට වැරදි නිගමන වලට එළඹීම.**

**04. වැරදියට තර්ක කොට නිවැරදි නිගමන වලට එළඹීම.**

තර්කය නිවැරදි ඥාණ මාර්ගයක් නොවන බව බුදු සමය පවසන්නේ මෙම හේතුන් නිසාය. සැක නැති කිරීම පිළිබඳව බුදුරජාණන් වහන්සේ සැම විටෙකම දැක් වූයේ දැඩි සැලකිල්ලකි. තමන් වහන්සේ දේශනා කළ ධර්මය ගැන යම් කිසි සැකයක් ශ්‍රාවකයන් ගේ සිතෙහි පැවතිය හොත් තමන්ගෙන් ප්‍රශ්ණ කළ යුතු බව දසැකඳුරු කර ගැනිමට ඉඩක් නොලැබිණැයි , පසුව විපිළිසර නොවිය යුතු බවද පිරිනිවන් පෑමට ස්වල්ප වේලාවකට පෙර පවා උන් වහන්සේ ස්වකීය ශ්‍රාවක පිරිසට දේශනා කලහ. එහෙත් ශ්‍රාවක පිරිස නිහඬව බලා සිටියහ. එහිදි බුදුරදුන් අවධාරණය කළ කරුණ සිතිමේ හා විමසිමේ නිදහස පිළිබඳ බෞද්ධ මතය කවරේ දැයි තිරණය කිරිමට හොඳම සාක්ෂියකි. එය නම්, "ඔබ ප්‍රශ්ණ නො අසන්නේ ශාස්තෘවරයාණන් කෙරෙහි ගෞරවය නිසා නම් එය තම යහලුවෙකුට වත් සැල කළ යුතුය." යන්නයි.

---


විශේෂ නිවේදනය

මෙම මාසික දහම් පත්‍රිකාව මාස්පතා ඔබ නිවසට ගෙන්වා ගත හැක.
ඒ සඳහා වැඩි විස්තර අප සංගමයේ ලිපි හුවමාරු ලිපිනය වන ලේකම් දෙහිවල, බෝද්ධෝදය සංගමය.
අංක 26 සී, දම්සත් සෙත් සෙවන, සුබෝධාරාම පාර, දෙහිවල. යන ලිපිනයෙන් විමසන්න.
දුරකථනය 0112728779 / 0112718070

මුද්‍රණය හශිනි ග්‍රැෆික්ස්- නො. 06 සුබෝධාරාම පාර, දෙහිවල.